ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව
காணி ஆணையாளர் நாயகத்தின் திணைக்களம்
LAND COMMISSIONER GENERAL'S DEPARTMENT
"මිහිකත මැදුර", ඉඩම් මහලේකම් කාර්යාලය, 1200/6, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.
"மிஹிகத்த மெதுர", காணிச் செயலகம், 1200/6, இராஜமல்வத்த வீதி, பத்தரமுல்ல.
"Mihikatha Medura", Land Secretriat,1200/6, Rajamalwatta Road, Battaramulla.
☎ 011 279 7400
🖷 011 286 4051

මගේ අංකය / எனது இல / My No. LCGD/AD/7/7/1 (2020) — ඔබේ අංකය / உமது இல / Your No — දිනය / திகதி / Date 2020.02. 26

චක්‍රලේඛ අංක **2020/10**

සියළුම ප්‍රාදේශීය ලේකම්වරු
සියළුම පළාත් ඉඩම් කොමසාරිස්වරු
ඉඩම් කොමසාරිස්/ සහකාර ඉඩම් කොමසාරිස්වරු (අන්තර් පළාත්)

## රජයේ ඉඩම් ආඥා පනත යටතේ නිකුත් කරන ලද දීර්ඝකාලීන බදුකර උකස් තැබීම සඳහා අවසරදීම

දීර්ඝකාලීන බදුකර උකසට තබා ණය ලබා ගැනීමේ සහ ලබාදීමේ ප්‍රවණතාවයේ වැඩිවීමක් වර්තමානයේ දක්නට ලැබේ. එසේ වුවද, බදුකරුවන් මෙන්ම බැංකු/ මූල්‍ය ආයතන, රජයේ නිලධාරීන් අතර රජයේ ඉඩම් සම්බන්ධයෙන් ලියන ලද බදුකර උකස් කිරීමේ නීතිමය විධිවිධාන සම්බන්ධයෙන් දැනුම් පරතරයක් පවතින බැවින් නීතිමය ගැටළු මතු වී ඇති බව මා වෙත නිරීක්ෂණය වී ඇත. එබැවින් දීර්ඝකාලීන බදුකර උකස් කිරීමේ ක්‍රියාවලිය විධිමත්කරණය කිරීමේ අරමුණින් මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ.

02. බදුකරුවෙකු විසින් බදුකරයක් උකස් තැබීම සඳහා වූ අවසරය ඔබගෙන් ඉල්ලා සිටින විටදී අදාල බැංකුව/ මූල්‍ය ආයතනය ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයේ ලියාපදිංචි මූල්‍ය ආයතනයක් නම් උකස් තැබීම සඳහා අවසර දීමේ ඉදිරි කටයුතු සිදුකළ හැකිය. බදුකරයක් උකස් තැබීම සඳහා අවසර දීමේ බලධාරියා වන්නේ ඉඩම් කොමසාරිස් ජනරාල් බැවින් පහත සඳහන් ලේඛන ඔබගේ නිර්දේශය සහිතව පළාත් ඉඩම් කොමසාරිස්/ (අන්තර් පළාත්) ඉඩම් කොමසාරිස්/ සහකාර ඉඩම් කොමසාරිස් මඟින් මා වෙත එවීමට කටයුතු කරන්න.

i. බදුකරුගේ ඉල්ලීම.
ii. මූල්‍ය ආයතනයේ/ බැංකුවේ එකඟතාවය
iii. බදු ගෙවා ඇති බව සනාථ කරගැනීම සඳහා රිසිට්පත් සහ බදු ලෙජරයේ සහතික කළ පිටපත
iv. මේ දක්වා වූ සියලුම පත්‍ඉරුවල සහතික කළ පිටපත්
v. බදුකරයේ හා පැවරුම් ඔප්පුවල සහතික කළ පිටපත්
vi. උකස් ඔප්පු කෙටුම්පත (නීතිඥ අත්සන හා නිල මුද්‍රාව සහිත)

03. උකස් ඔප්පු කෙටුම්පත බදුකරයේ කොන්දේසිවලට යටත්ව සකස් කළ යුතු අතර **"ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංක ............. හා ............. දිනැති ලිපියෙන් ලද අනුමැතිය මත"** යනුවෙන් සටහනක් උකස් ඔප්පු කෙටුම්පතට ඇතුලත් විය යුතුය. එය උකස් ඔප්පු කෙටුම්පතට ඇතුලත් කිරීම සඳහා බදුකරුවන් දැනුවත් කරන්න.

04. මා විසින් උකස් කිරීමට අනුමැතිය ලබාදීමේ දී අනුමත උකස් ඔප්පු කෙටුම්පතෙහි පිටපතක් ද ඔබ වෙත එවන අතර ඒ අනුව සකස්කර ලියාපදිංචි කරන ලද උකස් ඔප්පුවෙහි පිටපතක් ලබාගෙන ගොනුකර තබන්න. බදුකරු විසින් නියමිත පරිදි බදු මුදල් ගෙවන්නේද අවධානයෙන් සිටිය යුතු අතර යම් හෙයකින් බදුකරු බදුගෙවීම පැහැර හරින්නේ නම් බදුකරු හා බැංකුව/ මූල්‍ය ආයතනය විධිමත්ව දැනුවත් කිරීමට කටයුතු කළ යුතු වේ.

05. බදුකරු විසින් ණය ගෙවීම පැහැර හැර ඇති අවස්ථාවකදී ඉඩම වෙන්දේසි කර ණය අයකර ගැනීමට බැංකුවට/ මූල්‍ය ආයතනයට හැකියාව ඇති අතර ඒ සඳහා මාගේ පූර්ව අනුමැතිය ලබාගත යුතුය. මූල්‍ය ආයතනය එවැනි ඉල්ලීමක් සිදුකළ විට පූර්ව අනුමැතිය ලබාගැනීම සඳහා මා වෙත යොමු කළ යුතු අතර එහිදී බදුකරුවන්ගෙන් අයවීමට ඇති හිඟ බදු මුදලක් වේ නම් ඒ පිළිබඳව ද මා වෙත දන්වා එවන්න. බදුකරු විසින් රජයට ගෙවිය යුතු හිඟ බදු මුදල් ද අයකර ගැනීමට යටත්ව බදු ඉඩම වෙන්දේසි කිරීම සඳහා මා විසින් අනුමැතිය ලබා දෙනු ඇත. වෙන්දේසියේ දී සුදුසු ගැනුම්කරුවෙකු ඉදිරිපත් නොවන අවස්ථාවලදී බැංකුව/ මූල්‍ය ආයතනය විසින් විකුණුම් සහතිකයක් (Sale of Certificate) සකස් කිරීමට අනුමැතිය ඉල්ලා සිටිනු ඇත. එවැනි ඉල්ලීමක් ඉදිරිපත් වූ විට විකුණුම් සහතිකයේ කෙටුම්පතක්, අදාළ පත්‍රිකා වල සහතික කළ පිටපතක් හා සියලුම බදු මුදල් ගෙවා ඇති බවට සහතිකයක් සමඟ බැංකුවේ ඉල්ලීම් ලිපියේ පිටපතක් ඔබගේ නිර්දේශය සහිතව පළාත් ඉඩම් කොමසාරිස්/ (අන්තර් පළාත්) ඉඩම් කොමසාරිස්/ සහකාර ඉඩම් කොමසාරිස් මඟින් මා වෙත එවීමට කටයුතු කළ යුතු වේ.

06. මාගේ අනුමැතිය ලද පසු බැංකුව/ මූල්‍ය ආයතනයේ විකුණුම් සහතිකය විධිමත්ව සකස් කර ලියාපදිංචි කිරීමට කටයුතු කරනු ඇත. ලියාපදිංචි විකුණුම් සහතිකයේ පිටපතක් ගෙන්වාගෙන අදාළ ගොනුවේ ගොනුකර තැබීමට කටයුතු කරන්න. බැංකුව/ මූල්‍ය ආයතනය විසින් සුදුසු ගැනුම්කරුවෙකු වෙත බදුකරය පවරන අවස්ථාවක දී බදුකරය පැවරීම සඳහා මාගේ පූර්ව අනුමැතිය ලබාගත යුතු බැවින් ඒ අනුව පැවරීමට අවශ්‍ය ලේඛන මා වෙත එවන්න. මෙහිදී නව ගැනුම්කරුවන් බදුකරයේ කොන්දේසි හා බැඳී පවතින බැවින් ඒ පිළිබඳව බැංකුව/ මූල්‍ය ආයතනය මෙන්ම පුද්ගලයන් ද දැනුවත් කිරීමට කටයුතු කරන්න.

මෙම චක්‍රලේඛය අනුව කටයුතු කිරීමේ දී යම් ගැටළුකාරී තත්වයක් මතුවේ නම් ඒ පිළිබඳ මා විමසන්න.

ආර්.එම්.සී.එම්.හේරත්
ඉඩම් කොමසාරිස් ජනරාල්

පිටපත්:

01. ජනාධිපති ලේකම්, ජනාධිපති කාර්යාලය - කරු. දැ.ගැ.ස.
02. ලේකම්, ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය - කරු. දැ.ගැ.ස.
03. ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති - සියලුම ලියාපදිංචි බැංකු හා මූල්‍ය ආයතන දැනුවත් කිරීම සඳහා
04. අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය